01) පාඩම හෝ ඒකකය - නමස්කාර ගාථා සහ ටීකා සීපද ගායනා කරමු

02) ඉගෙනුම් ඵල -

- නමස්කාර ගාථා වල සංස්කෘතික පසුබිම විස්තර කරයි.
- ටීකා සීපද ගායනාවන්හි සංස්කෘතික පසුබිම විස්තර කරයි.
- නමස්කාර ගාථා වල සහ ටීකා සීපද ගායනාවන්හි සුවිශේෂතා පැහැදිළි කරයි.
- නමස්කාර ගාථා සහ ටීකා සීපද ගායනාවන්හි නිවැරදි නාදමාලා ගවේෂණය කරමින් ගායනයට පෙළඹෙයි .
- අදාළ ගායනා නිවැරදි නාදමාලා අනුව ගායනා කරයි .

03) ශිෂ්‍යා කළ යුතු කාර්යයන් -

- 10 ශ්‍රේණිය පළමු වාරයේ ඔබ උගත් නමස්කාර ගාථා සහ ටීකා සීපද ගායනා වල සමාජ හා සංස්කෘතික පසුබිම පිළිබඳව ඔබේ මතකය අවදි කරගන්න.
- එසේම e-nenapiyasa සාමාන්‍ය පාඩම් යටතේ අන්තර්ගත විෂය කරුණු හා සති පාසල් කාර්ය පත්‍රිකා තුළින් ඔබ ගවේෂණය කළ විෂය කරුණු ද යළි මතකයට නගා ගන්න.
- දැන් ඔබට මෙම ගායනා පිළිබඳව යම් අවබෝධයක් ඇතැයි සිතනවා.
- පහත සඳහන් කවි හොඳින් අධ්‍යයන කරන්න.

**<u>නමස්කාර ගාථා</u>**

සම්මා සම්බුද්ධ ඤාණේන

සම්මා සම්බුද්ධ දේශනා

සම්මා සම්බුද්ධ ලෝකස්මිං

සම්මා සම්බුද්ධ තේ නමෝ

මේ රූං විරාජිත සමං - විය බුද්ධ රාජං

සිරි දන්ත සාගර සමං - විය ධම්ම රාජං

සප්තකූට පබ්බත සමං - විය සංඝ රාජං

ශ්‍රී බුද්ධ ධම්ම ගුණ සංඝ වරං නමාමි

**වීකා සීපද**

හෙමින්..... හෙමින්.....

තවද..... ඌරන්නු, ගෝනුන්ට, සාවුන්ට වෙඩි තියන්න වල් පාරක් දිගේ කිට්ටු කරගෙන යන්නා වාගේ...

හෙමින් හෙමින් මම ගේකට යන කලට.....

එකෙක් ඇවිත්.....

තවද..... අත්තා, මුත්තා, පනත්තා, කිත්තා, කිරිකිත්තා, සෝලියා, පාඩියා කාලේ මහා උස් කුණාටු පොල් ගසකින් ගෙඩි පනහක් හැටක් සිද හෙලන්නා වාගේ.....

එකෙක් ඇවිත් දුන්නයි මගෙ පිට මැදට......

ඒ ගුටි කකා......

තවද......නැන්දා, මාමාගේ ගෙදර ගොස් හොද හොද්දක් බතක් මාළුවක් එක්ක බත් පිගානක් කැවා වාගේ.....

ඒ ගුටි කකා මම පිට වී යන කලට.....

මම්ම මටම......

තවද..... නැන්දා, මාමා, ආච්චී, ආතා, හුරා, නැනා කෙනෙක් එක්ක සන්තෝස වේලාවකදී කොක් හඩලා සිනා සෙන්නා වාගේ.....

මම්ම මටම ඉළ ඇට නැත හිනාවට......

- ඉහත සඳහන් ගායනා කට පාඩම් කර ගන්න. අන්තජර්ාලය භාවිතා කරමින් මෙම ගායනා වල නිවැරැදි නාද මාලාව අධ්‍යයනය කරන්න. එම නාදමාලා අනුව ගායනයට පුහුණු වන්න. එම ගායනා රසවින්දනයට යොමු වන්න.

04) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, Website, LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක -

- e-තක්සලාව - https://www.e-thaksalawa.mo.go.lk
- e-නැණ පියස - Course : 10 ශ්‍රේණිය නර්තනය - https://www.enenapiyasa.lk
- වෙනත් - (YouTube) - https://www.youtube.com/watch?v=b4e4m-j9DjU
  https://www.youtube.com/watch?v=zF472bxwy3U
  https://www.youtube.com/watch?v=ppzqNieGteI
  https://www.youtube.com/watch?v=EeeXFCO8FoE
  https://www.youtube.com/watch?v=SI2AdTvwPV0
  https://www.youtube.com/watch?v=vmfXohNWBRg

05) අතිරේක පොත්/සඟරා -

- 10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත, සෞන්දයර් අධ්‍යාපන දෙපාතර්මේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.